# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 3 දරන නිවාස සහ නගර සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 15 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.

අභ්‍යාසලාභියකු වැඩ කරන කාලය.

4. අභ්‍යාසලාභියකු වැඩ කරන සාමාන්‍ය කාලය—

(අ) යම් එක් දිනයක දී (ආහාර ගැනීම සඳහා පැය එකක විවේකයක් ද ඇතුළුව) පැය නවයක් ; සහ

(ආ) යම් එක් සතියක දී පැය හතළිස් පහක්

නොඉක්මවිය යුතු ය.

අතිකාල දීමනාව.

5. වැඩ කරන සාමාන්‍ය කාලයෙන් පසුව හෝ වැඩ කරන සාමාන්‍ය කාලය ඉක්මවා හෝ සේවා යෝජකයකු විසින් අභ්‍යාසලාභියකු සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඔහුට 3 (1) වන වගන්තිය යටතේ ගෙවිය යුතු දීමනාවේ සාමාන්‍ය පැයක අනුපාතිකය මෙන් එකහමාරක අනුපාතිකය අනුව ගණන් බලන ලද අතිකාල දීමනාවක් ඒ සේවා යෝජක විසින් ඒ අභ්‍යාසලාභියාට ගෙවිය යුතු ය.

වෛද්‍ය නිවාඩු.

6. නිවාඩු සඳහා වූ ඉල්ලුම් පත ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කර ඇත් නම්, රෝගාතුරභාවය හේතුකොටගෙන, දින හතක් නොඉක්මවන කාල සීමාවක් හෝ කාල සීමාවල එකතුවක් හෝ සඳහා වූ නිවාඩු, තමාට ගෙවනු ලැබිය යුතු සම්පූර්ණ දීමනාව සහිතව ලබා ගැනීමේ හිමිකම පුහුණු වීමේ කාල සීමාව තුළ දී අභ්‍යාසලාභියකුට තිබිය යුතු ය.

ඇතැම් නීති සහ සාමූහික ගිවිසුම් අභ්‍යාස ලාභීන්ට අදාළ නොවිය යුතු බව.

7. සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතෙහි, කාර්මික ආරාවුල් පනතෙහි, පඩි පාලක සභා ආඥාපනතෙහි, වෘත්තීය සමිති ආඥාපනතෙහි, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන සහ මේ පනතේ උපලේඛනයෙහි I වන තීරයෙහි නිශ්චිතව සඳහන් රක්ෂාවකට අදාළ යම් සාමූහික ගිවිසුමක්, පුහුණු වීමේ කාල සීමාව තුළ දී අභ්‍යාසලාභියකු කෙරෙහි අදාළ නොවිය යුතු ය.

ඇතැම් නීති අභ්‍යාස ලාභීන්ට සහ සේවායෝජකයන්ට අදාළ විය යුතු බව.

8. (1) හදිසි අනතුරකින් සිදුවන හානිය හෝ මරණය සම්බන්ධයෙන් කම්කරුවකුට ගෙවිය යුතු වන්දියට අදාළව කම්කරු වන්දි ආඥාපනතෙහි ඇති විධිවිධාන, අභ්‍යාසලාභියා ඒ ආඥාපනතෙහි අර්ථානුකූල කම්කරුවකු වූවාක් මෙන්, අභ්‍යාසලාභියකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට අදාළව ඒ පනතේ ඇති විධිවිධාන, සෑම සේවායෝජකයකු සහ අභ්‍යාසලාභියකු කෙරෙහි ම, ඔවුන් ඒ පනත යටතේ පිළිවෙළින් සේවායෝජකයකු සහ සේවා නියුක්තයකු වූවාක් මෙන් අදාළ විය යුතු ය.